සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය - I

**13 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ගැලපෙන පිළිතුරට අදාළ අංකය තිත් ඉර මත ලියන්න

(01) ශ්‍රී ලංකාවේ නර්තන කලාව හා බැඳි වාද්‍ය භාණ්ඩ නාම ලේඛනයක් ඇතුලත් ග්‍රන්ථවල නම සඳහන් වරණය වන්නේ,
(1) ථූප වංශය, මුවදෙව්දාවත, මහාවංශය
(2) ථූප වංශය, දළදා සිරිත, දඹදෙණි අස්න
(3) මහාවංශය, දළදා සිරිත, දඹදෙණි කතිකාවත.
(4) බෝධි වංශය, මහා වංශය, ථූප වංශය
(5) පූජාවලිය, දඹදෙණි අස්න, උමම්ග්ග ජාතකය (........)

(02) නර්තන කලාව පිළිබඳව රූකම් හමුවන ස්ථානය වන්නේ,
(1) යාපහුව, සූතිගර චෛත්‍යය, සැටදාගෙය.
(2) දෙගල්දොරුව, ගනේගොඩ දේවාලය, ලංකාතිලකය.
(3) යාපහුව, ඇම්බැක්කේ, ගඩලාදෙණිය.
(4) මැදිරිගිරිය, අටදාගෙය, සැටදාගෙය.
(5) කොට වෙහෙර, ලංකාතිලකය, ගනේගොඩ දේවාලය. (........)

(03) තෙල්මේ, වඩිග පටුන, මරු රාක්ෂ නැමැති නර්තන අංග අයත් ශාන්තිකර්ම අනුපිළිවෙලින් ඇති වරණය වන්නේ
(1) දෙවොල් මඩුව, සන්නියකුම, රටයකුම.
(2) සූනියම් යාගය, දෙවොල් මඩුව, සන්නියකුම.
(3) දෙවොල් මඩුව, සූනියම් යාගය, දහඅට සන්නිය.
(4) සන්නියකුම, දෙවොල් මඩුව, රටයකුම
(5) දෙවොල් මඩුව, රට යකුම, සූනියම් යාගය. (........)

(04) කුඳ කුජි ගත වට්ටම, පට්ටුතාල් මාත්‍රය හා සිය පදය යන නර්තන කුමන සම්ප්‍රදායන්ට අයත්වේද?
(1) සබරගමු, උඩරට, පහතරට
(2) උඩරට, සබරගමු, පහතරට
(3) පහතරට, උඩරට, සබරගමු
(4) උඩරට, පහතරට, සබරගමු
(5) පහතරට, සබරගමු, උඩරට (........)

(05) උඩරට හා සබරගමු නැටුමෙහි පොදුවේ දක්නට ලැබෙන වන්නම් නාමයන් වන්නේ,
(1) කෝකිල ගජගා, ගාහක
(2) ගජගා, ගාහක, සැවුලා
(3) හනුමා, තුරගා, සුරපති
(4) මුසලඩි, ඊරඩි, කිරලා
(5) කොවුලා, තිසරා, මයුරා (........)

(06) දේශීය සංගීතයෙන් පෝෂිත නාට්‍ය ද්විත්වයකි.
(1) දෙපානෝ, ලියතඹරා
(2) සිංහබාහු, ලියතඹරා
(3) දෙපානෝ, නරිබෑනා
(4) හංසවිල, මානසවිල
(5) වෙස්සන්තර, දෙපානෝ (........)

(07) ගැටබෙරය, පහතරට බෙරය හා දවුල සඳහා සුවිශේෂී වු කෙටස් තුනක් පිළිවෙලින් සඳහන් වන්නේ

(1) බෙරපුහුල, හයිතට්ටුව, කන්වරය (2) බෙරපුහුල, හයිතට්ටුව, කඩිප්පුව

(3) සුරත්තට්ටුව, වෙනිවර, කඩිප්පුව (4) තට්ටුව, ඇස, ඉල්ලම

(5) ගැටිය, ඉල්ලම, කැපුම්හම (........)

(08) ''අගය වඩන කවි වරුණ රඟය දැනෙයි කල රචනා මෙම කවි පදයේ,

(1) ලඝු අක්ෂර 20 කි ගුරු අක්ෂර 2 කි (2) ලඝු අක්ෂර 22 කි ගුරු අක්ෂර 4 කි

(3) ලඝු අක්ෂර 18 කි ගුරු අක්ෂර 2 කි (4) ලඝු අක්ෂර 16 කි ගුරු අක්ෂර 6 කි

(5) ලඝු අක්ෂර 20 කි ගුරු අක්ෂර 3 කි (........)

(09) කොහොඹා කංකාරියේ හා පහතරට දෙවොල් මඩුවේ පුදලබන දෙවිවරු අනුපිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ,

(1) රුප්පා යකුන්, වලි යකුන්, බණ්ඩාර දෙවිවරු, කඩවර සත්තට්ටුව

(2) බණ්ඩාර දෙවි, මෙලෙයි යකුන්, පත්තිනි, කතරගම දෙවි.

(3) වැදි යකුන්, සත්පත්තිනි. රටයකුන් හා පාර්වතී.

(4) කුවේණිය, කොහොඹා දෙවි, දෙවොල් දෙවි, කතරගම දෙවි.

(5) කඩවර දෙවි, වීරමුණ්ඩ දෙවි, රිද්දී බිසව්, දොළහ දෙවියන් (........)

(10) පිළිවෙලින් සොකරි, කෝලම් හා නාඩගම්වල එන පාත්‍රයන් තිදෙනෙකි.

(1) වෙදරාල, විදානේ හා ආඩිගුරු.

(2) කාලි, කෝලමා, බහුබූතයා.

(3) පච්චමීණ, නොංචි, සෙල්ලන්ලමා..

(4) විදානේ, පච්චමීණ, මුදලි.

(5) කාලි, සොත්තානා, පුරන්සිනා. (........)

(11) කරදිය හා පරෙවිය යනු මුද්‍රා නාට්‍යයන්හි සංගීත අධ්‍යක්ෂණය සිදුකරන ලද්දේ,

(1) අමරදේව හා ෂෙල්ටන් ප්‍රේමරත්න මහතුන්.

(2) ඩී. ආර්. පීරිස් හා ලයනල් අල්ගම.

(3) අමරදේව හා ලයනල් අල්ගම මහතුන්.

(4) ෂෙල්ටන් ප්‍රේමරත්න හා මොහොමඩ් ගවුස්.

(5) ඩබ්ලිව්. එම්. විමලසිරි සහ ආනන්ද සමරකෝන්. (........)

(12) ශාන්ති දේව ඝෝෂ් විසින් නිර්මාණය කළ මුද්‍රා නාට්‍යය වන්නේ,

(1) රාමායනය. (2) විජයාවතරණය

(3) සීතාහරණ. (4) සකුන්තලා.

(5) රන්දියවර. (........)

(13) උදය ශංකර් නිෂ්පාදනය කළ සුප්‍රසිද්ධ නෘත්‍ය නාටක දෙක වන්නේ,

(1) රාම ලීලා, රාධ ක්‍රිෂ්ණා (2) කල්පනා, ජීවනයේ රිද්මය.

(3) ශ්‍යාමා, භාරත රශ්මි. (4) කල්පනා, ගීතාංජලී.

(5) කල්පනා, නලදමයන්ති. (........)

(14) 'ප්‍රං' නමැති අවනද්ධ භාණ්ඩය භාවිතා කරන භාරතීය නර්තන සම්ප්‍රදාය වන්නේ,

(1) භරත. (2) කථක්.

(3) මණිපූරි. (4) කථකලි

(5) ඔඩිසි. (........)

(15) භරත නර්තන සම්ප්‍රදායට අයත් නොවන රංග වස්ත්‍රාභරණයකි.
(1) කිරීටම්. (2) සූර්ය පිරෙයි.
(3) කාසි මාලෙයි. (4) නේත්‍ර පට්ටම්.
(5) ජිමික්කි. (........)

(16) කථක් නර්තනයේ ලක්නව් සරාණාවට අයත් ප්‍රසිද්ධ පුද්ගලයකු වන්නේ,
(1) ගෝපිනාථ්. (2) උදය ශංකර්.
(3) අච්චන් මහරාජ්. (4) ඨාකූර් ප්‍රසාද්.
(5) ශ්‍රීමතී මේනකා. (........)

(17) හංසවිල නාට්‍යය සඳහා ප්‍රධාන වශයෙන්ම සම්බන්ධ වූ ශිල්පීන් වන්නේ,
(1) තමරා තොව්මරෝවා, ජින් කොරලි.
(2) වෙයි කොස්කිව්, ගලීනා උලනෝවා.
(3) මාරි ටැන්ග්ලින්, නිජින්සකි.
(4) මාර්තා ග්‍රැහැම්, ශලීනා උලනෝවා.
(5) මාරියස් පෙටිපා, ඇලෙක්සැන්ඩ්‍රා. (........)

(18) කථකලි නර්තන සම්ප්‍රදායේ රඟ දක්වෙන කතා පුවත් ඇතුලත් භාරතීය ග්‍රන්ථ තුනකි.
(1) රාමායනය, මේඝ දූතය, මහාභාරතය.
(2) රාමායනය, මහාභාරතය, භගවත් ගීතාව.
(3) මහාභාරතය, පංචතන්ත්‍රය, කාව්‍ය දර්ශය.
(4) ගීත ගෝවින්දය, මේඝ දූතය, භගවත් ගීතාව.
(5) පංචතන්ත්‍රය, මහාභාරතය, රාමායනය. (........)

(19) උඩරට වෙස් ඇඳුම් කට්ටලයට අයත් නොවන ආයිත්තමකි.
(1) හස්නකඩය. (2) පායිම්පත.
(3) කෙමෙත්ත (4) අත්පටිය.
(5) උල් උඩය. (........)

(20) බටහිර බැලේ නාට්‍ය වර්ධනය කිරීමට අනුග්‍රහය දක්වූ ප්‍රංශ රජ කෙනෙකි.
(1) අටවන හෙන්රි. (2) 14 වන ලුවී.
(3) වික්ටර් එමානුවෙල් රජු. (4) 2 වන විලියම් රජු.
(5) මහා පෙඩ්රික් රජු. (........)

(21) තිල්ලානා හා ආමද් යන නර්තන අංග අයත්වන නර්තන සම්ප්‍රදායන් පිළිවෙලින් දක්වූ විට,
(1) කථකලි හා මණිපූරි. (2) භරත හා මණිපූරි.
(3) භරත හා කථක්. (4) මණිපූරි හා කථක්.
(5) කථකලි හා කථක්. (........)

(22) පහතරට නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මවල හඳුනාගත හැකි නාට්‍යමය අවස්ථාවක් නොවන්නේ,
(1) අඹ විදමන. (2) මරා ඉපැද්දවීම.
(3) ඇස් බන්ධනය. (4) පොත් කඩේ පාලිය.
(5) දෙවොල් ගොඩබැස්ම. (........)

(23) දන්ඩියමේ සරඹ හා දොඹින පද අයත් වන්නේ,
(1) උඩරට හා පහතරට නැටුමට. (2) පහතරට හා සබරගමු නැටුමට.
(3) උඩරට හා සබරගමු නැටුමට. (4) සබරගමු හා උඩරට නැටුමට.
(5) සබරගමු හා උඩරට නැටුමට. (........)

(24) අවනද්ධ භාණ්ඩ අතරට ගැනෙන වාද්‍ය භාණ්ඩය තෝරන්න.

(1) උඩැක්කිය. (2) දඬු බෙරය.
(3) හොරණෑව. (4) හක් ගෙඩිය.
(5) පන්තේරුව. (........)

(25) සබරගමු නර්තන සම්ප්‍රදායේ ව්‍යාප්තියට බලපෑ ශිල්පියෙකි.

(1) සිරිබෝහාමි මහාතා. (2) ජේ. ඊ. සේදරමන් මහතා.
(3) පණීභාරත මහතා. (4) කපුකොටුව මහතා.
(5) කිරිගණිත ගුරු. (........)

- **අංක 26 සිට 35 තෙක් වූ ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.**

26. සොලොසා සංකය පළමුව පෙරුම් පිරූ බලයෙන් දා ... මෙය ශාන්තිකර්ම වලදී ගැයෙන ..............කවියකි.

27. කොහොඹා කංකාරියේ සියලුම යක්දෙස්සන් සහභාගී වෙමින් නර්තනයේ ................................... යෙදෙයි.

28. තාල රූප එකිනෙකට වෙනස් වනුයේ ............................................................සංඛ්‍යාවේ අඩු වැඩි වීම මතය.

29. මහනුවර යුගයේදී ................................................................................ වන්නම්, රාජ ස්තෝත්‍ර ගායනා කෙරිනි.

30. ශාන්තිකර්ම වලදී දේවාභරණ තැන්පත් කරන ස්ථානය .................................................................. නම් වේ.

31. නර්තනය අනිවාර්ය විෂයක් වශයෙන් ..................................................... දී පාසල් විෂය මාලාවට ඇතුලත් විය.

32. 19 වන සියවසේ ...................................................................විසින් කේරල කලා මණ්ඩලය ආරම්භ කරන ලදී.

33. බටහිර ශාස්ත්‍රීය නර්තනය සඳහා ..............................................ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිතා කෙරේ.

34. ආංගික අභිනයේදී ...................................................................යනුවෙන් ශරීරය කොටස් තුනකට බෙදා ඇත.

35. භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රය තුළ ..............................................රසය හැර අන් සියලු රස විවරණය කෙරේ.

- **අංක 36 සිට 50 දක්වා වූ ප්‍රශ්නවලට අදාළ පිළිතුරු දක්වා ඇති තිත් ඉර මත ලියන්න.**

36. රුක්මණී දේවි අරුන්ඩේල් විසින් භාරත නර්තනයට ඉදිකළ ආයතනය.
1. නම් කරන්න. ...............................................................................................................
2. පිහිටා ඇත්තේ කොහේද ? ..........................................................................................

37. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය වූ මුද්‍රා නාට්‍යය අතරින්, පහත සඳහන් මුද්‍රා නාට්‍යයන් බිහිකළ ශිල්පීන් කවුද?
1. හිරෝෂිමා ..........................................................................................................
2. චණ්ඩාලිකා ........................................................................................................

38. පහත වූ රස නිෂ්පත්තියට කවර භාවයන් මූලික වේද?
1. වීර ..................................................................................................................
2. කරුණා .............................................................................................................

39. මහනුවර යුගයේදි හමුවන දේශාටන වාර්තාකරුවන් දෙදෙනෙකු නම් කරන්න.

1. ..........

2. ..........

40. සබරගමු හා පහතරට කාන්තාවන් වෙනුවෙන් පවත්වන ශාන්තිකර්ම දෙක නම් කරන්න.

1. ..........

2. ..........

41. කොහොඹා කංකාරියේ එන ගායනය සහිත නර්තන අංග දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

42. පහතරට බෙරයට කියන නම් දෙකක් ලියන්න.

1. ..........

2. ..........

43. හේවිසි වාදනයට භාවිතා කරන අවනද්ධ භාණ්ඩ දෙකක් නම් කරන්න.

1. ..........

2. ..........

44. කථක් නර්තන සම්ප්‍රදායේ තාල වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න.

1. ..........

2. ..........

45 ලෝක නර්තන දිනය වශයෙන් නම් කළ,

1. දිනය කවදාද ?. ..........

2. එය කාගේ ජන්ම දිනයද ? ..........

46 කථකලි නර්තන සම්ප්‍රදායේ මූලික මුද්‍රා ගණන කියද ? ..........

47 අවකාශ භාවිතයේදී හමුවන තල ගණන කීයද ? ..........

48 කෝලම් නාටක වල හමුවන ගුරුලු රාක්ෂ කුමන වර්ගයට අයත් චරිතයක්ද ? ..........

49 රටයකුමේ එන නාට්‍යමය අවස්ථාවක් නම් කරන්න. ..........

50 ඉබන් බතුතා පැමිණියේ කවර සමයකද ? ..........

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# නර්තනය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

I වන කොටසින් ප්‍රශ්න 2 ක් ද, II, III, IV කොටස් වලින් ප්‍රශ්න එක බැගින්ද තෝරා ගෙන ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. (i) දෙ ං ත කු දොං ජිං ජිං ගත් තත් ජිං ගත්තත් ජිං ජිං කඩ තක
මෙම බෙර පදය ප්‍රස්ථාර කරන්න. (ලකුණු 06)

(ii) වන පැත්ත බිය පත්ව සයනම් ......
දුටත් යනෙන විටත් දුවන පිටත් පොට ගසා පනිමින ..... මෙම මුසලඩි වන්නමේ එන කවි පද දෙක ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 06)

(iii) කුද කුජී ගත වට්ටමේ කස්තිරම හා අඩව්ව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 08)

02. සන්නියකුම යනු විචිත්‍රවත් අංගයන්ගෙන් සපිරි ශාන්තිකර්මයකි.

(i) දෙබස් හා සංවාද ඇසුරින් කරුණු දක්වන්න. (ලකුණු 06)

(ii) රංග වස්ත්‍රාභරණ ඇසුරින් එය සනාථ කරන්න. (ලකුණු 06)

(iii) රංග භාණ්ඩ හා රංග භූමි අලංකරණය ඇසුරින් විමසන්න. (ලකුණු 08)

03. දේශීය ශාන්තිකර්ම තුළ විද්‍යාත්මක පදනමක් ඇති බවට මතයක් වේ.

(i) පැවැත්වීමට හේතු පදනම් කරගනිමින් කරුණු දක්වන්න. (ලකුණු 06)

(ii) රංග වස්ත්‍ර හා යොදා ගන්නා වර්ණ ඇසුරින් කරුණු දක්වන්න. (ලකුණු 06)

(iii) මනෝ චිකිත්සක වෛද්‍ය ක්‍රමයක් ලෙස අගයන්න. (ලකුණු 08)

## II කොටස

- **ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සපයන්න.**

04. නර්තන කලාවේ ප්‍රවර්ධනයට වවිධ යුගවලදී විවිධ පුද්ගලයින් දායක වී ඇත.

(i) විසිවන සියවසයේදී නර්තන ක්ෂේත්‍රයට පිවිසි කාන්තාවන් දෙදෙනා ඇසුරින් කරුණු දක්වන්න. (ලකුණු 06)

(ii) 2 වන රාජසිංහ රජුගෙන් ලද අනුග්‍රහය අගයන්න. (ලකුණු 06)

(iii) මහා පරාක්‍රමබාහු රජුගේ දායකත්වය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 08)

05. සොකරි ගැමි නාටකයේ චරිත නිරූපණය ඉතා සාර්ථක අයුරින් සිදු කිරීමට ගැමි කලාකරුවාට හැකි වී තිබේ.

(i) එහි කතා පුවත සරලව පහදන්න. (ලකුණු 06)

(ii) පාත්‍ර වර්ගයා හා ඔවුන්ගේ රංග වස්ත්‍රාභරණ, වේෂ නිරූපණය අගයන්න. (ලකුණු 06)

(iii) යොදාගෙන ඇති ගායන, වාදන, සංවාද ආදියෙන් නාටකය වර්ණවත් වන අයුරු විස්තර කරන්න. (ලකුණු 08)

## III කොටස

- **ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සපයන්න.**

06. පහත මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) කථක් නර්තනය රාජ සභා නර්තනයක් බවට පත්වීම. (ලකුණු 06)

(ii) 1917 න් පසු මණිපූරි නර්තනයේ ප්‍රවණතා. (ලකුණු 06)

(iii) කථකලි නර්තනය බිහිවීම කෙරෙහි බලපෑ ජන නාටක. (ලකුණු 08)

07. ශ්‍රී ලංකාවේ මුද්‍රා නාට්‍ය කලාවට ප්‍රභවය ලැබීමට හා විකාශණයට පෙර අපර දෙදිගම මුද්‍රා නාට්‍ය කලාවේ අභාසය ලැබුණි.

(i) භාරතීය නර්තන කලාවේ බලපෑම. (ලකුණු 10)

(ii) බටහිර බැලේ නාට්‍ය කලාවේ බලපෑම. (ලකුණු 10)

ඉහත කරුණු 2 ක සාකච්ඡා කරන්න.

## IV කොටස

- **ප්‍රශ්න එකකට පමණක් පිළිතුරු සපයන්න.**

08. (i) නූතන සමාජ ආර්ථික ප්‍රවණතා නර්තන කාලාවේ සාම්ප්‍රදායික ස්වරූපය වෙනස් කිරීමට දැඩිසේ බලපා ඇත. මෙම කියමන නිදසුන් 3 ක් දෙමින් පහදන්න. (ලකුණු 20)

09. මධ්‍යතන යුගයේ රූපවාහිනිය මගින් විකාශය වන නර්තන අංගයන් හි තත්වය,

(i) සංචලන (ලකුණු 06)

(ii) රංග වස්ත්‍රාභරණ (ලකුණු 06)

(iii) ගායනය හා වාදනය (ලකුණු 08)

යන සිරස්තල යටතේ විමසන්න.